මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone

# මතුගම අධ්‍යාපන කලාපය

දෙවන වාර පරීක්ෂණය - 2020 මාර්තු

| පෙරදිග සංගීතය I | 12 ශ්‍රේණිය | කාලය : පැය 02 යි |
|---|---|---|

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

01. පෙරදිග සංගීතයට අනුව ගායකයකු ශ්‍රැතිය තෝරා ගත යුත්තේ,
    1. මධ්‍ය සඩ්ජය පදනම් කරගෙනය.
    2. මන්ද්‍ර කෝමළ නිෂාදය පදනම් කරගෙනය
    3. තම ස්වභාවික හඬ මට්ටම පදනම් කරගෙනය
    4. ගුරුවරයාගේ ශ්‍රැතිය පදනම් කරගෙනය
    5. පන්තියේ සිසුන්ගේ පොදු ශ්‍රැතිය පදනම් කරගෙනය.

02. ගායකයකු සතු ගුණාංගයක් විය නොහැක්කේ,
    1. සප්තක තුනම ඇසුරු කිරීමය
    2. මුඛය විවෘතව තබා ගනිමින් ගැයීම
    3. පිට කොන්ද සෘජුව තබා ගනිමින් ගායනා කිරීම
    4. උච්චාරණය පැහැදිලි වීම.
    5. රාග පිළිබඳ නිවැරදි දැනුමකින් යුතුව ගායනා කිරීම.

03. භාව පූර්ණ ගායනයක් සඳහා ,
    1. ස්වර අභ්‍යාස කළ යුතුය.
    2. අ කාරයෙන් ගැයීම ප්‍රගුණ කළ යුතුය.
    3. ස්වර නිවැරදිව ගායනා කල යුතුය.
    4. තාම්පුරාව යොදා ගත යුතුය.
    5. හඬ පාලනයකින් යුතුව ගැයිය යුතුය.

04. ගීතයක හෝ වාදිතයක ආරම්භයේ සිට සමග්‍රහය දක්වා ඇති කොටස හඳුන්වන්නේ,
    1. උපජ් යනුවෙනි
    2. තිහායි යනුවෙනි.
    3. ජලා යනුවෙනි.
    4. මුඛඩා යනුවෙනි.
    5. ගමක් යනුවෙනි.

05. සමප්‍රකෘති රාග යුගලයක් වන්නේ,
    1. භාගේශ්‍රී - භීම්පලාසී
    2. දේස් - තිලක්කාමෝද්
    3. ආසාවරී - භාගේශ්‍රෘ
    4. ජය ජය වන්ති - දේස්
    5. හංසධ්වනි - බිහාග්

06. සංගීත විෂය ශාස්ත්‍රීයව අධ්‍යනය කරන ආධුනිකයකු මුලින්ම සැලකිය යුතු අභ්‍යාසය වන්නේ,
    1. රාග අභ්‍යාසයයි.
    2. ස්වර අභ්‍යාසයයි.
    3. තාල අභ්‍යාසයයි.
    4. ආලාප අභ්‍යාසයයි.
    5. තාන අභ්‍යාසයයි.

07. රාග ගායන සමය තීරණය කිරීමේදී " අද්ව දර්ශක " නොහොත් "සමය දර්ශක " ස්වරය ලෙස හැඳින්වෙන්නේ,
    1. ස 2. ග 3. ම 4. ධ 5. නි

08. මිනිස් සිරුර තුළ ශක්ති ස්ථාන ( චක්‍ර ) කීයක් තිබේද ?
1. 6 කි 2. 7 කි 3. 8 කි 4. 9 කි 5. 3 කි

09. රි ප වාදී සංවාදි වන රාග යුගලයකි,
1. ආශාවරී - ජෞනපූරි
2. දේස් - තිලක්කාමෝද්
3. භාගේශ්‍රී - භිමපලාසී
4. මාලකෞන්ස් - හංසධ්වනි
5. දේස් - ආසාවරී

10. ම ම ම ම / ප ප නි නි / සං සං සං නි / සං සං සං සං /
රිං රිංගුං රිං සං / රිං නි සං - / සං සං - නි / ධ ප ම ප /
ඉහත ස්වර ප්‍රස්ථාරයේ ස්වර රචනාව අයත් රාගය කුමක් ද?
1. දේස් 2. තිලක්කාමෝද් 3. ආසාවරී 4. භාගේශ්‍රී 5. භිම්පලාශ්‍රී

11. එම රාගයට සමප්‍රකෘති ලක්ෂණ දක්වන රාගය වන්නේ,
1. ජෞනපූරි 2. භිම්පලාසි 3. තිලක්කාමෝද්
4. දේස් 5. මාලකෞන්ස්

12. එම ස්වර ප්‍රස්තාරයේ මුල් පාදයට ගැළපෙන chords වන්නේන,
1. C / G / C / F 2. C / G / F / C 3. G / C / C / F 4. F / G / C / C
5. F / C / G / F

13. ඉහත ප්‍රස්ථාරයට අයත් රාගයට අනුව විවාදී ස්වරයක් යොදා ගත් අවස්ථාවක් දැක්වෙන පිළිතුර වනුයේ,
1. රිං නි සං 2. සං සං - නි 3. රිං රිංගුං රිසං 4. ධ ප ම ප 5. ම ම ප ප

14. ද්‍රැත ඛ්‍යාල් ශෛලියේ වාදනයක අවසානයේ වාදනය කරනුයේ,
1. ආලාප 2. උපජ් 3. ජලා 4. තිහායි 5. තාන්

15. තබ්ලාවක ගුණාත්මක බව අඩු වීමට බලපාන කරුණක් නොවන්නේ ,
1. බද්ධි සට්ටා වලින් ඉවත්ව තිබීම
2. ස්‍යාහි ගැලවී තිබීම
3. ගට් කොටසට ලෝහ කම්බියක් දැමීම
4. චාන්ටිය තැනින් තැන ඇදවී තිබීම
5. බද්ධි පලල අඩු කම

16. පහත ගී පාද අතුරින් සබරගමු ශාන්තිකර්ම ගීයක් වන්නේ,
1. උපත පෙරා කලිගු පුරා
2. හිස මුව තුල බෙල්ල
3. ආල වඩන ගන්ධ කුටියෙ
4. සුරතට රැගෙන
5. අන්ද්‍ර ගුවන් හැර නැංග

17. ජන ගී හා සම්බන්ධ කෘතියක් නොවන්නේ ,
1. හෙළ ගී වදුල 2. සිංහල ගී 3. නැළවිලි ගී
4. සරස සම්භව 5. ජන සංගීත සිද්ධාන්ත

18. කතෝලික පසන්, කන්තාරු තනුවල අභ්‍යාස ලද නාඩගම් ගී ඇතුළත් නාඩගමකි,

1. වෙස්සන්තර  2. බැලසන්ත  3. ඇහැලේපොල
4. විධුර  5. බ්‍රම්ෆෝර්ඩ්

19. රාගයක් ඉදිරිපත් කිරීමේදී නිරමාණාත්මකව ක්ෂණිකව ගොඩනගා ගන්නා නාද විග්‍රහ හඳුන්වන්නේ,

1. උපජ් යනුවෙනි.  2. ජලා යනුවෙනි.  3. මුඛඩා යනුවෙනි.  4. මූර්කි යනුවෙනි
5. චක්‍රදාර් යනුවෙනි.

20. " මිරිස් ඇඹුල ලුණු සමබර තිබ්බටු හොද්දෙන් දඩමස්සෙන් කැවයි "" යන කවි පාදය අයත් අවස්ථාව වන්නේ,

1. සාමූහික බව දනවන අවස්ථාවකි
2. අධ්‍යාපන කාරකයක් ලෙස යොදා ගත් අවස්ථාවකි.
3. දාර්ශනික බව පෙන්නුම් කෙරෙන අවස්ථාවකි.
4. සන්නිවේදන කාරකයක් ලෙස යොදා ගත් අවස්ථාවක්
5. සාරධර්ම අගයන් පිලිබඳ යොදා ගත් අවස්ථාවකි.

21. මේලයක අඩංගු වන්නේ,

1. ආරෝහණ ස්වර පමණි  2. වාදී සංවාදී ස්වර පමණි
3. අනුවාදී ස්වර පමණි  4. විවාදී ස්වර පමණි
5. විකෘති ස්වර පමණි

22. උදය සන්ධි ප්‍රකාශ රාගයක් වන්නේ,

1. පූර්වි  2. මාර්වා  3. පූරියා  4 භෛරව  5. ආසාවරී

23. තබ්ලාවක කොටසක් නොවන්නේ,

1. තුම්බා  2. ස්‍යාහි  3. බද්ධි  4. කුන්ඩි  5. සට්ටා

24. සොකරි නාටක ශෛලිය සඳහා අදාල නොවන ලක්ෂණයකි,

1. අනුරූපණ මාධ්‍ය යෙන් කතාව ගොඩනගයි
2. චරිත කොළපත් වලින් සෑදූ වෙස් මුහුණු පළඳිති.
3. තනු රටා උඩරට ශාන්තිකර්ම තනු ආශ්‍රිතව ගොඩනැගී ඇත.
4. කථා පුවත පත්තිනි දෙවියන් හා සම්බන්ධවය
5. හොරණෑව හා යක් බෙරය යොද ගනියි.

25. අපරදිග සංගීතයෙහි මේජර් සහ මයිනර් ස්කේලය හා වඩාත් සමාන වන්නේ,

1. බිලාවල් සහ ආශාවරී ථාටය  2. බමාජ් සහ භෛරවී ථාටය
3. බිලාවල් සහ කාෆි ථාටය  4. කාෆි සහ භෛරවී ථාටය
5. බිලාවල් සහ භෛරවී ථාටය

26. ස̇+ ස̇+ ස̇රි̇ ග̇රි̇ / සරි -ස රිග -රි මෙම තානාලංකාරය,

1. මිශ්‍ර තානයකි.  2. කූට තානයකි.
3. අලංකාරික තානයකි.  4. බෝල් තානයකි
5. සපට් තානයකි.

27. වයලීනය සුසර කරන ව්‍යවහාරික ක්‍රමය කුමක්ද?
1. ප̣ ස ප ස̇ 2. ප̣ රි ධ ග̇ 3. ම̣ ස ප රි̇ 4. ප̣ ස ධ ග̇
5. ස̣ ප̣ ස ප

28. උත්තරාංග වාදී රාගයක් නොවන්නේ,
1. දේස් 2. බිලාවල් 3. ආසාවරී 4. ජෞනපූරි 5. භෛරව

29. විවිධ තාල රූප හා දොහොරාවක් සහිත නූර්ති ගීයකි,
1. ආරන්නේ ඉන්නා 2. හරිමි රජ සැපා 3. දන්නෝ බුදුන්ගේ
4. ශ්‍රියා මනමත්වී 5. වාසනා දිනේකි මේක

30. නාත්‍රිත , තීම් , තොම් යනුවෙන් යෙදෙන ගායන ශෛලිය කුමක්ද ?
1. තිල්ලානා 2. වර්ණම් 3. පදම් 4. ජාතිස්වරම් 5. තරාණා

31. කෝමළ ගාන්ධාරය විවාදී ස්වරයක් ලෙස යෙදෙනුයේ,
1. ජෞනපූරි 2. ආසාවරී 3. දේස් 4. තිලක්කාමෝද් 5. භාගේශ්‍රී

32. තිහායි සහිත වූ යම්කිසි කොටසක් තෙවරක් වාදනය කොට අන්තිම අක්ෂරය සමග්‍රහයට පැමිණීම හඳුන්වන්නේ,
1. පරත් නමිනි. 2. තිහායි නමිනි 3. පල්ටා නමිනි 4. චක්‍රදාර් නමිනි
5. කායදා නමිනි

33. කටහඬෙහි ගුණාත්මක බව ඇති කිරීමට බලපාන සාධකයක් නොවන්නේ,
1. මුහුණු ප්‍රමාණය හා මාංශ පේශීවල පිහිටීම 2. ශරීරය කෘෂ වීම.
3. මුඛ කුහරයේ සහ නාස් කුහරයේ ධාරිතාව 4. දත්වල පිහිටීම
5. උගුරේ සිහින් බව හෝ මහත් බව

34. තිලවඩා , සහ ත්‍රිතාලයේ ගති ලක්ෂණය වෙනස් වීමට පාදක වී ඇත්තේ,
1. මිතිය වෙනස් නිසාය 2. මිතිය සමාන වුවද විභාග අසමාන නිසාය
3. ලයෙහි ඇති වෙනස්කම ය. 4. මිතිය සහ විභාග අසමාන නිසාය
5. මිතිය සහ ලය සමාන නිසාය.

35. දේස් , භාගේශ්‍රී රාග අයත් ඨාට යුගලය වන්නේ,
1. බිලාවල් - කාෆි 2. ඛමාජ් - කාෆි 3. බිලාවල් - ඛමාජ්
4. කාෆි - කාෆි 5. ඛමාජ් - බිලාවල්

- 36 සිට 50 දක්වා ඇති ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර හිස්තැනෙහි ලියන්න.

36. රිම පනි ස̇රි̇ ස̇නි / ධප මග රිග ස- තානාලංකාරය අයත් රාගය වන්නේ,
..........................................................................................................

37. ඉහත රාගයට සමප්‍රකෘති රාගයක් නම් කරන්න.
..........................................................................................................

38. එම සමප්‍රකෘති රාගයට අනුව නිර්මාණය වී ඇති රාගාශ්‍රිත සරල ගීයක් නම් කරන්න.
..........................................................................................................

39. ඉහත තානාලංකාරය අදාල රාගයේ මේලයට අයත් ස්වර ලියා දක්වන්න.

.......................................................................................................................................

40. එම මේලයෙන් උපන් තවත් රාගයක් නම් කරන්න

.......................................................................................................................................

41. " විශ්ව සංගීත ක්ෂේත්‍ර " කාගේ කෘතියක් ද ?

.......................................................................................................................................

42. නාඩගම් ගීයක් ගැයිමේදී එහි ගී පාදයක අග පිහිටි කිසියම් අක්ෂරයක් උචිත ස්වර රටාවන් අනුව තාලය නොබිදෙන සේ ඇද පැද ලෙලවා ගැයීම හඳුන්වන නම කුමක් ද?

.......................................................................................................................................

43. $C^m$ ස්කේලයට සමාන ථාටය කුමක්ද?

.......................................................................................................................................

44. "පාට වරුණ පුත " කුමන රංග ශෛලියේ ගීයක් ද ?

.......................................................................................................................................

45. $G^m$ chord එකට අයත් ස්වර ලියා දක්වන්න.

.......................................................................................................................................

46. " තිරිකිට" යනුවෙන් දෙවරක් යෙදෙන තාල යුගලයක් නම් කරන්න,

.......................................................................................................................................

47. ස ප ධ මීන්ඩ් ලෙස යෙදෙන පූර්වාංගවාදී රාගයක් වන්නේ,

.......................................................................................................................................

48. ශුද්ධ තාන සහ කූට තානයන්ගේ එකතුවෙන් සෑදෙන තාන විශේෂය කුමක්ද ?

.......................................................................................................................................

49. සරෝද් , සාරංගි , වයලින් , වැනි භාණ්ඩයන්ගෙන් කෙරෙන මීන්ඩ් වාදනය හඳුන්වන නම කුමක් ද ?

.......................................................................................................................................

50. දෙසුළු මැදුම් තුන් තිතට ගැළපෙන හින්දුස්ථානී තාලය කුමක් ද ?

.......................................................................................................................................

දෙවන වාර පරීක්ෂණය - 2020 මාර්තු

| පෙරදිග සංගීතය II | 12 ශ්‍රේණිය | කාලය : පැය 03 යි |
|---|---|---|

- ප්‍රශ්න 05 කට පමණක් පිළිතුරු සපයන්න.
- I කොටසින් ප්‍රශ්න දෙකකටද II කොටසින් එක් ප්‍රශ්නයකට ද III කොටසින් ප්‍රශ්න දෙකකටද පිළිතුරු සපයන්න.

## I කොටස

1.

a. ම ප ධ , ග , ම ග රි ස
b. නි ධ ප , ග රි ග ස
c. රි ම ප නි ධ ප , ධ ධ ප ම ප

i. ඉහත රාග හඳුනාගෙන නම් කරන්න. ( ලකුණු 06 )
ii. ඉහත ස්වර සංගති සඳහා අවශ්‍යය සලකුනු ( කෝමල , මන්ද්‍ර ) ලකුණු කොට නැවත ලියන්න. ( ලකුණු 03 )
iii. b රාගයට සමප්‍රකෘති වන රාගයේ රාග විස්තර 05 ක් ලියා දක්වන්න. ( ලකුණු 05 )
iv. ඉහත එක් රාගයකට අයත් විලම්භලය ගීයක ( බඩා ඛ්‍යාල් ) ස්ථායි කොටස ප්‍රස්ථාර කරන්න. ( ලකුණු 06 )

2. පහත කරුණු ආශ්‍රිතව පිළිතුරු සපයන්න.

| A | B | C |
|---|---|---|
| ඛමාජ් මේලගත ෂාඩව සම්පූර්ණ ජාතියට අයත් රාගයකි. | ධ හා ග වාදී සංවාදී වන ෂාඩව සම්පූර්ණ රාගයට අයත් රාගයකි. | ම හා ස වාදී සංවාදී වන ඖඩව ජාතියට අයත් රාගයකි. |

i. ඉහත රාගය ( A , B , C ) නම් කරන්න. ( ලකුණු 03 )
ii. ඉහත රාග සඳහා සමප්‍රකෘති වන රාග දෙකක් නම් කරන්න. ( ලකුණු 02 )
iii. එම සමප්‍රකෘති රාගදෙකේ සම විෂමතා ලියන්න. ( ලකුණු 06 )
iv. A ට අයත් රාගයේ මාත්‍රා 08 හා 16 තානාලංකාර දෙකක් ලියන්න. ( ලකුණු 04 )
v. C රාගයට අයත් ස්වර අභ්‍යාසයක් නිර්මාණය කරන්න. ( ලකුණු 05 )

3.

i. ගති , මිති , ලය පිළිබඳව උදාහරන සහිතව හැඳින්වීමක් කරන්න. ( ලකුණු 08 )
ii. දීප්චන්දි හා ත්‍රිතාල් යන තාල දෙගුන වශයෙන් ලියා දක්වන්න. ( ලකුණු 06 )
iii. ගායන සමය පිළිබඳව පුළුල් විස්තරයක් කරන්න. ( ලකුණු 06 )

## II කොටස

4.

i. ශ්‍රී ලංකාවේ ගැමි ගී තුළින් ගැමියාගේ අව්‍යාජත්වය ඉස්මතු වේ. ගැමි ගී යන්න නිර්වචනය කොට, ගැමියා ගැමි ගී භාවිතා කළ අවස්ථා පැහැදිලි කරන්න. ( උදාහරණ සහිතව ) ( ලකුණු 10 )

ii. මෙහෙ ගී අනාසාතාත්මක වීමට බලපාන කරුණු උදාහරණ සහිතව පැහැදිලි කරන්න. ( ලකුණු 05 )

iii. වැදි ගී වල සංස්කෘතික පසුබිම හා නාදමාලාවල ස්වභාවය පැහැදිලි කරන්න. ( ලකුණු 05 )

5.

i. ශ්‍රී ලංකාවේ උඩරට පළාත මුල් කොට ගනිමින් ව්‍යාප්ත වූ රංග ශෛලයික් ලෙස සොකරි රංග ශෛලිය හැදින්විය හැක. සොකරි රංග ශෛලිය පිළිබදව ඔබේ අදහස් දක්වන්න.( ලකුණු 10 )

ii. දේශීය තාල පද්ධතිය ගොඩනැගී ඇති ආකාරය හා දෙතිතේ ප්‍රභේද දක්වන්න. ( ලකුණු 06 )

iii. කෝලම් රංග සම්ප්‍රදායේ ලක්ෂණ 04 ක් ලියන්න. ( ලකුණු 04 )

## III කොටස

6.

i. පහත දැක්වෙනුයේ මෙරට සංගීතඥයින් කිහිප දෙනෙකු රචනා කරන ලද ග්‍රන්ථ කිහිපයකි. එම අදාල ග්‍රන්ථ ඔවුන්ගේ නම් අනුව වෙන්කොට දක්වන්න. ( ලකුණු 08 )

- ආනන්ද ජයසිංහ
- සී. ද . එස්. කුලතිලක
- බී. එස්. විජේරත්න
- ඩබ්. සිරිල් පෙරේරා
- ඩබ්. බී. මකුලොලුව
- එදිරිවීර සරත්චන්ද්‍ර
- විමල් අභය සුන්දර
- වින්සන්ට් සෝමපාල

- සංගීත සංහිතා
- සංගීත ශික්ෂන
- අභිනව මූලික ගීත
- පෙරදිග සංගීත ශාස්ත්‍රය
- ගීත විද්‍යා
- සිංහල ගැමි නාටකය
- නැලවිලි ගී
- ලංකාවේ සංගීත සම්භවය

ii. මහනුවර යුගයේ ශ්‍රී ලංකාවේ සංගීත විකාශය පැහැදිලි කරන්න. ( ලකුණු 12 )

7.

i. පහත දැක්වෙනුයේ රාගධාරී සංගීතයේ යොදා ගන්නා ශිල්ප ක්‍රම කිහිපයකි. ඒවා නිර්දේශිත රාග ඇසුරින් උදාහරණ දී හඳුන්වන්න.
A මීන්ඩ් B කන් C ගමක් D තිහායි ( ලකුණු 08 )

ii. තානාලංකාර වර්ග 04ක් උදාහරන සහිතව පහදන්න. ( ලකුණු 08 )

iii. F major / G major යන ස්කේල ලියා දක්වන්න. ( ලකුණු 04 )

8.

i. පෙරදිග හා අපරදිග සංගීත පද්ධති දෙකේ ලක්ෂණ ලියන්න. ( ලකුණු 08 )

ii. විශ්ව සංගීතයේ පද්ධති 05 කි. ඒවා නම් කරන්න. ( ලකුණු 05 )

iii. අප්‍රිකානු සංගීතය පිළිබදව කෙටි හැදින්වීමක් කරන්න. ( ලකුණු 03 )

iv.

/ ස ස ග - / රි නි - ස / ප - ග ප / ධ - සං - /
/ රිං - - ගං / සංරිං සං ධ ප / ම ග රි නි / - ස - ස /

ඉහත ස්වර ඛණ්ඩය බටහිර ප්‍රස්ථාර යක දක්වන්න. ( ලකුණු 04 )